## හක්මන ප්‍රාදේශීය සභාව
## මාතර දිස්ත්‍රික්කය
----------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි මස 29 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට හක්මන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සේවක ණය මුදල් ගිණුමෙන් රු.220,000 ක මුදලක් සාමාන්‍ය මුදල් ගිණුමට හර කර මුදල් මාරු ගිණුමකට බැර කර තිබූ අතර, 2014 දෙසැම්බර් 31 දින එකී මුදල, මුදල් මාරු ගිණුමට හර කර සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය එකී මුදලින් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් හක්මන නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකර 2013 වර්ෂයේදී පවරා දෙන ලද රු.94,000,000 ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) වරිපනම් බදු ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට රු.53,563 ක ඉදිරියට ගෙවූ වරිපනම් බදු මුදල් වරිපනම් බදු පාලන ගිණුමේ බැර ශේෂයක් ලෙස නොදැක්වීම නිසා එදිනට අයවිය යුතු වරිපනම් බදු එකී මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීමේදී යතුරුපැදි ණය වාරික සඳහා අයකරගෙන ඇති රු.360,000 ක මුදල වර්ෂයේ ආදායම් ආධාර බැර කර වැටුප් හා දීමනා වියදමට හර කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන ලෙජරයේ 309 වැය ශීර්ෂයට ප්‍රාග්ධන වැය ලෙස මාසිකව හර කරන ලද මුදල සහ ප්‍රා.ස. 14 අනුව එම වැය ශීර්ෂය යටතේ සඳහන් කරන ලද මුදල අතර වෙනස රු.6,515,804 ක් විය.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාව විසින් කරන ලද ප්‍රාග්ධන වියදම් මත සභාව සතුව පවතින රු.6,104,315 වටිනා ඉඩම් හා ගොඩනැගිලි හා අනෙකුත් භෞතික සම්පත්වල අගය ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම

සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 06 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.54,455,220 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.55,287,087 ක් වූයෙන් වෙනස රු.831,867 ක් විය.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට රු.873,211 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කිරිමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම්වලින් අඩුකර දක්වා තිබුණි.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.10,283,988 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.16,899,732 ක් විය.

(ඇ) රු.1,704,583 ක් වටිනා ගිණුම් ශේෂ 12 ක් ඉකුත් වර්ෂය කිහිපයක සිට දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතියද ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.72,101,970 ක් වටිනා වත්කම් හා රු.4,637,067 ක් වටිනා බැරකම් සම්බන්ධ උපලේඛන, යාවත්කාලීන හා විධිමත්ව පවත්වාගෙන යන ලේඛන යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.5,453,698 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,440,901 ක් විය. සමාලෝචිත වර්ෂයේදී සභාවේ ස්වයං උත්පාදන හා ව්‍යවස්ථාපිත ආදායම රු.18,094,441 ක් වූ අතර එකී මුදලින් සභාවේ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සහ අතිකාල හා වෙනත් දීමනා ගෙවීම සඳහා රු.11,241,960 ක මුදලක් වැය කිරිමට සිදුව ඇත. එය ඉහත ආදායමින් සියයට 62 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා අනෙකුත් දීමනා ගෙවීම් හැර සභාවේ අනෙකුත් පුනරාවර්ථන වැය වූ රු.12,350,723 ක් මුදලක් වියදම් කිරිම සඳහා ඉහත ආදායමින් ඉතිරිවන මුදල රු.6,852,481 කි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සභාවට ආදායම් ඌනතාවකයට මුහුණ දීමට සිදුව ඇත.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 387 | 439 | 639 |
| කුලී මුදල් | 6,377 | 5,029 | 557 |
| බලපත්‍ර ගාස්තු | 1,905 | 890 | - |
| වෙනත් ආදායම් | 10,820 | 11,734 | 6,385 |

2.2.2 වරිපනම් හා අක්කර බදු

2014 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු රු.891,430 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම් අධිගාස්තුව සමඟ රු.403,388 ක් විය. ඒ අනුව ලැබිය යුතු වරිපනම් බදු වටිනාකම රු.1,294,818 ක් වුවද සමාලෝචිත වර්ෂය තුල දඩ සමග ලැබුණු මුදල රු.753,067 ක් විය. 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් බදු මුදල රු.541,751 ක් විය. 2014 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු රු.88,960 ක්වූ අතර වර්ෂයට අදාල බිල්කිරීම් රු.9,620 ක් විය. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට රු.98,580 ක් වූ ලැබිය යුතු අක්කර බදු මුදලින් වර්ෂය තුල ලැබී තිබුනේ රු.600 ක් පමණි. 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අක්කර බදු වටිනාකම රු.97,980 ක් විය.

2.2.3 බදු කුලී

2014 ජනවාරි 01 දිනට හිඟ බිම්බදු රු.261,900 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම් දඩ මුදල් සමඟ රු.149,930 ක් විය. වර්ෂය තුල දඩ සමග ලැබුණ මුදල රු.127,930 කි. 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බිම්බදු මුදල රු.283,900 ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 245,921 |
| මුද්දර ගාස්තු | 5,153,440 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මංමාවත් කළමනාකරණය

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සම්මත කර ගෙන ඇති අයවැය ලේඛනයට අනුව ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය වර්ග කි.මී. 48.4 ක් වූ අතර ග්‍රාම නිලධාරී වසම් ගණන 34 කි. පාරවල් වල දිග කි.මී. ප්‍රමාණය හා කොන්ක්‍රීට්/තාර, පස් පාරවල් ආදි ලෙස ස්වභාවය අනුව පාරවල් වර්ගීකරණය කර සභාවට අයත් මාර්ග ගණන අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ සභාවට අයත් මාර්ග ගැසට් පත්‍රයේ පල කරවා ප්‍රසිද්ධ කළයුතු වුවද 1995 වර්ෂයේදී මාර්ග 136 ක් ගැසට් කර තිබූ අතර, ඉන් පසු සභාවට අයත් මාර්ග සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ඇති මංමාවත් සම්බන්ධයෙන් එක් එක් මාර්ගයේ දිග, පළල, ආරම්භක ස්ථානය හා අවසන් වන ස්ථානය එකී මංමාවත්වල ස්වභාවය එනම්, තාර, කොන්ක්‍රීට් කුට්ටිගල් බොරළු පස් හා වීථි රේඛා යනාදී තොරතුරු ඇතුළත් කර මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා ගත යුතු වුවත් එම තොරතුරු විධිමත් ලෙස සටහන් කරමින් එකී ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී තාර දමන ලද මාර්ග 01 ක්ද, කුට්ටිගල් අතුරන ලද පාරවල් 54 ක්ද කොන්ක්‍රීට් පාරවල් 06 ක්ද පස්, බොරළු පාරවල් 04 ක්ද වශයෙන් මීටර් 7846.1 ක් සංවර්ධනයට රු.36,118,191 ක මුදලක් වැයකර තිබුණද මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 3.2.1 වැසිකිළි සහනාධාර

2014 වර්ෂයේ අයවැය ලේඛනයෙහි සෞඛ්‍ය සේවා වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 164 දෙනෙකුට වැසිකිළි සහනාධාර ලබාදීමට රු. 960,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රතිලාභීන් 164 දෙනෙකු තෝරා ගැනීමට අදාලවූ නිර්නායකයන් විගණනයට අනාවරණය නොවීය.

(ආ) සහනාධාර ඉල්ලුම් කිරීමට අදාල ඉල්ලුම්පත්වල ප්‍රතිලාභීන්ගේ ආදායම සඳහන්ව තිබුණද එකී ආදායම අදාල ග්‍රාම නිලධාරියාගෙන් සහතික කරගත යුතු බවට ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබූ අතර ප්‍රතිලාභීන්ගේ ආදායම පිළිබඳව සහතිකයක් ලබාදුන් ආකාරය විගණනයට තහවුරු නොවීය.

(ඇ) සභාව ඉකුත් වර්ෂවලද වැසිකිළි ආධාර ගෙවා ඇති බව අනාවරණය වූ අතර එකී ගෙවීම් සටහන් කරන ලද ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි. එම නිසා එක් වරක් වැසිකිළි ආධාර ගෙවන ලද ප්‍රතිලාභියෙකුට නැවත වරක් ආධාර ගෙවා ඇත්ද යන්න තහවුරු කරගත නොහැකි විය.

(ඇ) ප්‍රතිලාභින්ට වැසිකිළි ආධාර ගෙවීමේදී රු.5,000, රු.6,000, රු.8,000, රු.10,000 බැගින් ගෙවා තිබූ අතර, එකී විවිධ ආධාර ප්‍රමාණයක් ගෙවීම සඳහා ගත් සභා තීරණයන් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ඉ) 2014 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය අනුව සෞඛ්‍ය සේවා වැඩසටහනෙහි අයවැය ගත පුනරාවර්තන ආදායම රු. 5,836,110 ක් වූ අතර පුනරාවර්තන වියදම රු. 7,587,250 ක් විය. ඒ අනුව ඒකී වැඩසටහනෙහි ඌනතාවය රු. 1,751,140 ක් වී තිබියදීත් වැසිකිළි සහනාධාර සඳහා රු. 960,000 මුදලක් ප්‍රතිපාදනය කිරීමට හේතු විගණනයට අනාවරණය නොවීය.

( ඊ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය අනුව සෞඛ්‍ය කාර්යයන් සඳහා දරන ලද වියදම එක් වර්ෂයක් තුලදී රුපියල් එක් දහස ඉක්මවන්නේ නම් අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුඥාව ලබාගත යුතු වුවද එවැනි අනුමැතියක් රහිතව සමාලෝචිත වර්ෂයේ අවසන් වන විට ප්‍රතිලාභීන් 94 දෙනෙකුට වැසිකිළි ආධාර ලෙස රු.574,000 ක් ගෙවා තිබුණි.

3.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර සභාවට 2013 වර්ෂයේදී පවරා දෙන ලද නගර ශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් පිරිවැය රු.54,000,000 ක් බව අනාවරණය වූ අතර, මෙම ගොඩනැගිල්ලට අවශ්‍ය රැස්වීම් ශාලා පුටු සහ අනෙකුත් අවශ්‍ය උපකරණද එම වර්ෂයේදීම ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබේ.

(අ) නගර ශාලාව ඉදිකිරීම සඳහා රජයේ මුදල් රු. 54,000,000 ක් වැයකර තිබුණද වසර 02 ක කාලයක් මහජන ප්‍රයෝජනය සඳහා විවෘත නොකිරීම හේතුවෙන් සභාවට ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ පුටු 571 ක් සහ අනෙකුත් උපකරණ ගිණුම් වල පෙන්වා නොමැති අතර එකී වත්කම් 2014 වර්ෂයේ නිෂ්ක්‍රීයව පවතිණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| තෘතියික | 01 | 02 | - | 01 |
| ද්විතියික | 26 | 22 | 04 | - |
| ප්‍රාථමික | 38 | 41 | - | 03 |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 05 | - | 05 |
| | 65 | 70 | 04 | 09 |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් සභාවේ අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබුණි.

5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වියදම් පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය